## සිංහල හා දෙමළ ඉතිහාස - II

ආදිවාසීන් යන්නෙන් රටක වර්තමානයෙහි ආධිපත්‍යය දරණ ජනයා පැමිණීමට පෙර එරට විසූ ජනයා ගැන කියැවෙයි. ආදිවාසීන්ට එකල රටේ ආධිපත්‍යයක් තිබිණි ද නැත් ද යන්න ගැන අපට එතරම් දෙයක් කිව නොහැක්කේ ඒ සමාජයෙහි බලය, ආධිපත්‍යය වැනි ආකල්ප තිබිණි ද යන්නවත් අප නොදන්නා බැවිනි. ඇමරිකාව, ඕස්ට්‍රේලියාව, කැනඩාව නවසීලන්තය ආදී රටවල නම් බ්‍රිතානීහු ඒ රටවල බලය අල්ලාගෙන එහි සිටි ජනයා මුළුමනින් ම මෙන් ඝාතනය කළහ. එහෙත් දකුණු ඇමරිකාවේ එවැන්නක් නො සිදුවිය. ආක්‍රමණිකයෝ එහි සිටි වැසියන් මුළුමනින් ම ඝාතනය නො කළහ. ඔවුහු එහි සිටි වැසියන්ගෙන් ඉතිරි වූ පිරිස සමග මිශ්‍ර වූහ.

අප විසින් අර්ධ වෛදිකයන් යනුවෙන් හැඳින්වෙන්නන් දඹදිව සිට ලංකාවට පැමිණෙන විට ලංකාවේ සිටි යක්ෂ නාග ගෝත්‍රවලට නායකයන් සිටි බව පැහැදිලි ය. ඒ නායකයන් රජවරුන් වී ද නැද්ද යන්න අපි නො දනිමු. මණිඅක්ඛික නා රජුන් ආදීන් ගැන වංසකතාවල කියැවෙන නමුත් ඒ රජවරුන් දැයි අප නොදන්නේ ඔවුන්ට රජවරුන් යැයි කියන්නේ අර්ධ වෛදිකයන් නිසා ය. අප වැදි රජු ගැන කියන නමුත් වැදි ජනයාට එසේ රජවරුන් සිටි බවක් දැන ගැනීමට නැත. මනමේ නාඩගම ලියනු ලැබ ඇත්තේ වැදි ලේඛකයකු විසින් නොව රජවරුන් ගැන දැන සිටි පැරණි සිංහලයකු විසිනි. රජ යන සංකල්පය වැදි සංස්කෘතියේ තිබිණි ද යන්න ප්‍රශ්නයකි. පෘතුගීසි ඉතිහාසඥයකු වූ ක්වේරෝස් කෝට්ටේ රජුට අධිරාජයා (එම්පරර්) යැයි කියන්නේ සිංහලයන්ට අධිරාජයකු සිටි නිසා නොව පෘතුගීසි සංස්කෘතියට සාපේක්ෂව ක්වේරෝස්ට රජු අධිරාජයා ලෙස පෙනුණු බැවිනි. දැනුම එලෙස සංස්කෘතියට (මනසට හා පංචේන්ද්‍රියට අමතරව) සාපේක්ෂ බව පැහිදිලි වෙත් දී බටහිර විද්‍යාවේ පාවෙන පරඬැල් වැනි මහාචාර්යවරුන්ට ඒ ගැන අවබෝධයක් නොවීමම බටහිර සංස්කෘතික යටත්විජිතවාදයේ ලක්ෂණයකි.

අර්ධ වෛදිකයන් ලංකාවට පැමිණෙන විට මෙරට සිටි ගෝත්‍රිකයෝ මුළුමනින් ම සමූලඝාතනය කරනු නො ලැබූහ. අර්ධ වෛදිකයන් හා යක්ෂ ගෝත්‍රිකයන් අතර සටන් තිබී ඇති බවත් ඒ සටන්වලදී මිනිසුන් මියගොස් ඇති බවත් පැහැදිලි ය. එහෙත් අර්ධ වෛදිකයෝ යක්ෂ ගෝත්‍රිකයන් සමූලඝාතනය නො කළහ. අර්ධ වෛදිකයන් මෙරටට පැමිණෙන විට සිටි සියළු ගෝත්‍රික ජනයා ආදීවාසීන් ලෙස හඳුන්වන්නේ නම් ඔවුන්ගෙන් ඉතා වැඩි කොටසක් අර්ධ වෛදිකයන් සමඟ මිශ්‍ර වීමෙන් ගොඩ නැගුණු සිංහලයන් ආදීවාසීන් නොවන්නේ ඇයි? මෑතක් වන තුරු සිංහලයන් නොවී සිටි එකම ගෝත්‍රය පමණක් ආදිවාසීන් වීමට ඇති පදනම ඔවුන් සිංහලයන් නොවීම පමණකි.

මා ඉතිහාසය සම්බන්ධයෙන් අසන ප්‍රශ්න බටහිර සම්ප්‍රදායේ පුහුණුව ලැබූ ඉතිහාසඥයන් අසන ප්‍රශ්න නොවන්නේ නම් වරද මා අත නො වේ. සිංහල ජාතිය ගොඩනැගී ඇත්තේ අර්ධ වෛදික ගෝත්‍ර, වංශ හා නාග, දේව, (කල්ගත වී වුවත්) යක්ෂ ආදී ගෝත්‍ර මිශ්‍ර වීමෙන් බව පැහැදිලි ය. එහි දේශපාලන ආධිපත්‍යය, බලය පළමුවෙන් තිබී ඇත්තේ අර්ධ වෛදික වංශයක් වූ සිංහ වංශයට ය. ජාතිය සිංහල වූයේ ඔවුන්ගේ නමින් යැයි සිතීම සාධාරණ ය. පසුව වෙනත් වංශවල අය ද සිංහලයේ රජ කමට පත් වී ඇත. ඒ කෙසේ වෙතත් සිංහල ජාතියේ ආර්ථිකය හා සංස්කෘතිය ලබාගත්තේ කිනම් වංශයකින් ද ගෝත්‍රවලින් ද?

මෙරටට පැමිණි අර්ධ වෛදිකයන් දඹදිව සිටිය දී වැව් නිර්මාණය කළ බවට සාධකයක් නැත. ඔවුන් හුරු පුරුදු වී සිටියේ ගංගානිම්න සංස්කෘතිවලට ය. ඔවුන් ලංකාවට පැමිණ පදිංචි වී ඇත්තේ ද පිහිටි රට හා රුහුණු රට ගංගා ඔය ආශ්‍රිත ප්‍රදේශවල බව පැහැදිලි ය. වැව ලංකාවට ආවේණික නිර්මාණයකි. වැව් තාක්ෂණය යක්ෂ සංස්කෘතියට අයත් වී යැයි සිතිය හැකි ය. එසේත් නැතහොත් ඒ නාගයන්ගේ සංකල්පයක් විය හැකි ය. වැව් ආශ්‍රිත ව නාග සංකේතය ඇත්තේ නාගයන් ජලය සමග බැඳුණු ගෝත්‍රයක් නිසා ම විය නො හැකි ය. අදටත් සිංහලයෝ මහවැලි ජලාශ නිර්මාණයේ දී ද නාග සංකේතය අමතක නො කරති. වැව් සංකල්පය ලංකාවේ නාගයන්ගේ යැයි සිතිය හැකි ය. යක්ෂ ගෝත්‍රිකයන් වැව් කර්මාන්තයට තමන් ඉරානයෙන් (පර්සියාවෙන්) ගෙනා තාක්ෂණය මිශ්‍ර කරන්නට ඇත. යක්ෂ ගෝත්‍රිකයන් සම්බන්ධයෙන් හිටපු මිනුම්පතිවරයකු වූ ඩෙනිස් ප්‍රනාන්දු මහතා දක්වා ඇති අදහස් මෙහි දී වැදගත් වෙයි. වැව, වාර්මාර්ග ආදිය අර්ධ වෛදිකයන්ගේ සංස්කෘතියට අයත් නොවේ. යක්ෂ ගෝත්‍රිකයන් වී ගොවිතැන ප්‍රධාන කෘෂිකර්මයෙහි ද දක්ෂයන් වූ බව පෙනෙයි. සිංහ වංශය ප්‍රමුඛ අර්ධ වෛදිකයන් රටේ දේශපාලන බලය අල්ලා

© Prof. Nalin De Silva

ගත්ත ද ඔවුන්ට තම ගංගාශ්‍රිත ආර්ථිකය හා ඒ සමග බැඳුණු සංස්කෘතිය සිංහල ජාතියට දීමට නොහැකි වී ඇති බව පෙනී යයි. ප්‍රධාන වශයෙන් ම යක්ෂ ගෝත්‍රික ආර්ථිකය සිංහල ජාතියේ ආර්ථිකය බවට පත් වී ඇත. අද පවා අපි වැවයි දාගැබයි (අර්ථයෙන් ධර්මයෙන්) යනුවෙන් කියන සංස්කෘතියෙහි ලෞකික පැත්ත, ආර්ථිකය විශේෂයෙන් ම යක්ෂ ගෝත්‍රයෙන් ලබාගෙන ඇති බව පෙනී යයි.

දේශපාලන බල ව්‍යුහය සිංහ වංශයෙන් ද ආර්ථිකය යක්ෂයන්ගෙන් හා නාගයන්ගෙන් ද ලබාගත් සිංහල ජාතියේ සම්පූර්ණයෙන් ම ආර්ථික නොවූ සංස්කෘතියක් නාග හා දේව ගෝත්‍රිකයන්ගෙන් ලබාගෙන ඇති බවත් මහින්දාගමනයෙන් පසු ඒ සංස්කෘතිය බුදු දහම පදනම් කරගෙන වර්ධනය වී ඇති බවත් පෙනී යයි. නාග හා දේව ගෝත්‍රිකයන් බුදු දහමට විරෝධයක් නොපෑම මගින් පෙන්වන්නේ ඔවුන්ගේ සංස්කෘතිය හා බුදුදහම බිහිවූ සමාජයේ සංස්කෘතිය අතර විශාල වෙනස්කම් නොවූ බව ය. බුදුදහම සමග ලැබුණු සංස්කෘතිය පසු කලෙක ආර්ථිකය කෙරෙහි ද දේශපාලනය කෙරෙහි ද බලපා ඇති බව ඉතිහාසයෙන් මනාව පැහැදිලි වෙයි. ආර්ථිකය, දේශපාලනය හා සංස්කෘතිය එකිනෙකට බැඳුනු සංසිද්ධි ය. ඒවා අතර ඇත්තේ අන්තර්සම්බන්ධයකි. සිංහල සංස්කෘතියෙහි සිංහල බෞද්ධ චින්තනය මත ගොඩනැගෙන දැනුම් පද්ධතියක සමාජයීය විකාශය කෙරෙහි ඒ සංසිද්ධි තුන ම බලපාන ආකාරය කිව යුතු ය. සිංහල බෞද්ධයෝ බහු හේතුවාදී වෙති. ඔවුහු බටහිරයන් මෙන් නොව ඒකහේතුවාදයට ගොදුරු නො වෙති. එබැවින් සිංහලයෝ ඌනිතවාදීහු නො වෙති. මුළු මහත් බටහිර විද්‍යාව ම අවසාන විග්‍රහයෙහි දී ඌනිතවාදී වෙයි. සිංහල බෞද්ධයන්ට ඇතැම් සිංහල ජාතිකවාදී යැයි කියන බටහිර විද්‍යාවේ පාවෙන පරඬැල්වලට මෙන් නොව බටහිර සංස්කෘතියෙහි ගොඩනැගෙන ඇතැම් ප්‍රවාද ප්‍රතික්ෂේප කිරීමේ බාධාවක් නැත. සිංහල බෞද්ධ චින්තනය යනුවෙන් අප අදහස් කරන්නේ පොදුවේ ගත්කල සිංහල බෞද්ධයන්ගේ චින්තනය ය. අප යොදාගන්නා චින්තනය යන සංකල්පය ජාතික චින්තනය යන විසුරුණු අදහසින් බෙහෙවින් වෙනස් වෙයි.

මේ සියල්ලෙන් අප කියන්නේ සිංහල ජාතිය යනු අර්ධ වෛදිකයන් හා ඔවුන් මෙරටට පැමිණෙන විට මෙහි වාසය කළ ගෝත්‍ර බොහෝමයක් එකතු වී ගොඩනගන ලද ජාතියක් බවත් එහි දී අර්ධ වෛදිකයන්ගේ දේශපාලන ව්‍යුහය හා දේශපාලන බලය වැදගත් වුවත් මෙරට විසූ ගෝත්‍රිකයන්ගේ සංස්කෘතිය හා ආර්ථිකය බොහෝ දුරට සිංහල ජාතියට හිමි වූ බවත් ය.  මෙයින් කියැවෙන්නේ අර්ධ වෛදිකයන්ගේ සංස්කෘතිය හා ආර්ථිකය කිසිසේත් ම සිංහල ජාතියට බලපා නැති බවවත් යක්ෂ නාග ආදී ගෝත්‍රිකයන්ගේ පාලන ව්‍යුහ කිසිවක් සිංහල ජාතිය හිමිකර නොගත් බවවත් නො වේ. ඒ ඒ සංරචකය සම්බන්ධයෙන් වැඩි බලපෑමක් කළ පිරිස් ගෝත්‍ර අපි ඉහත සඳහන් අයුරින් හඳුනාගනිමු. පසුකාලීනව දෙවනපෑ තිස් රජු සමයෙහි බුදු දහම හඳුන්වාදීමෙන් පසුව ඇති වූ වෙනස්කම් ද මූලික වශයෙන් මේ රාමුව තුළම සාකච්ඡා කළ හැකි බව පැහැදිලි වෙයි.

සිංහල ජාතිය පඬුඅබා දවස ඇරඹුන ද එහි සංස්කෘතියෙහි හා ආර්ථිකයෙහි ඉතිහාසය එයට වඩා පැරණි ය. ගෝත්‍ර හා වංශ එකතුකර ගොඩනගන ලද ජාතියට පඬුඅබා රජු දවස ලැබුණේ දේශපාලන ව්‍යුහයකි. අදාළ දේශපාලන ආධිපත්‍යය අර්ධ වෛදිකයන් සතුවිය. අපි විජය රජුගෙන් සංකේතවත් වන අර්ධ වෛදිකයන් විසින් පමණක් සිංහල ජාතිය ගොඩනගන ලද්දේ ය යන මතය  ප්‍රතික්ෂේප කරමු. එපමණක් නොව එසේ පැමිණි අර්ධ වෛදිකයන්ගේ සමාජයෙහි මෙරට විසූ ගෝත්‍ර ගිලී ගොස් නැත. එබැවින් සිංහල ජාතිය යනු කිසිසේත් ම අර්ධ වෛදිකයන්ගේ ජාතියක් හෝ අර්ධ වෛදිකයන්ගේ සංස්කෘතික හෝ ආර්ථික හෝ ආධිපත්‍යයක් තිබූ ජාතියක් හෝ නො වෙයි. පඬුඅබා රජුගෙන් සියවස් කිහිපයක් ඇවෑමෙන් වැදි ගෝත්‍රය හැරෙන්නට මෙරට විසූ අනෙක් සියළු ම ගෝත්‍ර හා අර්ධ වෛදිකයන් ද මිශ්‍ර වී සිංහල ජාතිය ස්ථාවරත්වයකට පත් වි ඇත. අද වන විට වැදි ගෝත්‍රය ද සිංහල ජාතියට එකතු වී ඇත. වැදි ගෝත්‍රය ද ඇතුළු සියළු ගෝත්‍රවල හා අර්ධ වෛදිකයන්ගේ ලක්ෂණ සිංහල ජාතියෙහි අඩු වැඩි වශයෙන් දක්නට ලැබෙයි. වැදි ගෝත්‍රය හා යක්ෂ ගෝත්‍රය අතර තිබූ සමීප සම්බන්ධය හේතුකොටගෙන වැදි ගෝත්‍රය සිංහල ජාතියට එකතුවීමට පෙර සිට ම වැදි ගෝත්‍රයෙහි සංස්කෘතික ලක්ෂණ සිංහල ජාතියට එක් වී යැයි සිතිය හැකි ය. සිංහල බෞද්ධ සංස්කෘතියෙහි දේව ඇදහිලි ද දක්නට ඇත්තේ මේ මිශ්‍රණය හේතුකොටගෙන ය. ඒ හින්දු ආගමින් ලැබුණු ලක්ෂණ නොව පැරණි ගෝත්‍රිකයන්ගේ දේව යක්ෂ ඇදහිලිවලින් ලැබුණු දෑ ය. සිංහල බුද්ධාගමෙහි (ඉංගිරිසින්ගේ බුද්ධාගම හා දේවාලගම) ඇත්තේ දේවාල මිස කෝවිල් නොවන බව අවධාරණය කළ යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva